# වාර්ෂික වාර්තාව
# வருடாந்த அறிக்கை
# Annual Report
# 2017

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
විගණන සේවා කොමිෂන් සභාව

இலங்கை சனநாயக சோசலிசக் குடியரசின்
கணக்காய்வு சேவைகள் ஆணைக்குழு

**Audit Service Commission of**
**Democratic Socialist Republic of Sri Lanka**

# වාර්ෂික වාර්තාව

# 2017

# විගණන සේවා කොමිෂන් සභාව

**අංක 35 ඒ,**

**ආචාර්ය එන්.එම්.පෙරේරා මාවත,**

**කොළඹ 08.**

**දුරකථන : 0112-674659 /0112674660**
**ෆැක්ස් : 0112-674657**
**ඊ මේල් :** secretaryasc@sltnet.lk
ascoffice@sltnet.lk

## දැක්ම

මහජන බැදියාව සහ වගවීම සඳහා කැප වූ

විශිෂ්ට විගණන සේවයක්

## මෙහෙවර

වෘත්තීයමයභාවය, නිපුණත්වය සහ යහපාලනය පෙරදැරි කර ගත් රාජ්‍ය

විගණන සේවයක් ස්ථාපනය කිරීම තුළින් රාජ්‍ය සම්පත්වලට වගවීම

සහතික කිරීම

## අපගේ අගයන්

- ස්වාධීනත්වය
- අපක්ෂපාතීත්වය
- අවංකභාවය
- නවෝත්පාදනය
- පාරදෘශ්‍යභාවය
- වගවීම
- වෘත්තීය නිපුණත්වය

# විගණන සේවා කොමිෂන් සභාව

## සභාපති

එච්.එම්. ගාමිණී විජේසිංහ මහතා

## සාමාජිකයින්

විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මහතා

අයි. ගාමිණී අබේරත්න මහතා

වී. කන්දසාමි මහතා

ඩබ්ලිව්.ජේ. සෝමපාල පෙරේරා මහතා

# පෙළගැස්ම



| අනු අංකය | කාරණය | පිටුව |
|---|---|---|
| 1. | හැඳින්වීම | 1 |
| 2. | විගණන සේවා කොමිෂන් සභාවේ බලතල, කාර්යයන් සහ කර්තව්‍යයන් | 1 |
| 3. | විගණන සේවා කොමිෂන් සභාවේ කාර්ය සාධනය-2017 | 2-6 |
| 3.1 | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 ඇ ව්‍යවස්ථාව යටතේ පැවරී ඇති බලතල හා කර්තව්‍යයන්හි ප්‍රගතිය | 2 |
| 3.2 | කොමිෂන් සභාව විසින් ඉටු කරන ලද අනිකුත් කර්තව්‍යයන් | 2 |
| 3.3 | පරිපාලන සහ මූල්‍ය කටයුතු | 3-6 |
| 4. | කාර්ය මණ්ඩලය | 7-8 |
| 4.1 | කාර්ය මණ්ඩල සංයුතිය | 7 |
| 4.2 | සංවිධාන සටහන | 8 |
| 5. | කොමිෂන් සභා රැස්වීම් | 9 |
| 6. | ස්තුතිය | 9-10 |

# විගණන සේවා කොමිෂන් සභාව

## 1. හැඳින්වීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVII වන පරිච්ඡේදයේ 153 අ (1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණන සේවා කොමිෂන් සභාව ස්ථාපිත කර ඇත.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව විගණකාධිපතිවරයා විගණන සේවා කොමිෂන් සභාවේ සභාපතිවරයා වන අතර එම කොමිෂන් සභාවේ සෙසු සාමාජිකයන් වන්නේ,

අ. නියෝජ්‍ය විගණකාධිපති හෝ ඊට ඉහළ ධුරයක් උසුලන ලද විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විශ්‍රාම ලත් නිලධරයන් දෙදෙනෙකු

ආ. ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ ,අභියාචනාධිකරණයේ හෝ මහාධිකරණයේ විශ්‍රාම ලත් විනිශ්චයකාරවරයකු

ඇ. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශ්‍රාම ලත් I වන පන්තියේ නිලධරයකු

## 2. විගණන සේවා කොමිෂන් සභාවේ බලතල, කාර්යයන් සහ කර්තව්‍යයන්

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 ඇ විධිවිධාන අනුව කොමිෂන් සභාවට අදාළ බලතල, කාර්යයන් සහ කර්තව්‍යයන් පහත පරිදි වේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයට අයත් සාමාජිකයින් පත් කිරීම්, උසස් කිරීම්, මාරු කිරීම්, විනය පාලනය හා සේවයෙන් පහ කිරීම

(ආ) අමාත්‍ය මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන ප්‍රතිපත්තිවලට යටත්ව ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයට අයත් සාමාජිකයින්ගේ සේවයට බඳවා ගැනීමේ පටිපාටි, පත් කිරීම්, මාරු කිරීම්, උසස් කිරීම්, විනය පාලනය හා සේවයෙන් පහ කිරීමට අදාළ රීති සකස් කිරීම

(ඇ) නීතිය මඟින් ස්ථාපිත ජාතික විගණන කාර්යාලයේ වාර්ෂික ඇස්තමේන්තුව සකස් කිරීම

(ඈ) නීතිය මඟින් සලකනු ලබන පරිදි වූ වෙනත් බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම

ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවාවක් ස්ථාපිත කිරීමට අදාළ ජාතික විගණන පනත මෙතෙක් සම්මත නොවීම තුළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් විගණන සේවා කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලතල හා කර්තව්‍යයන් පූර්ණ ලෙස ක්‍රියාත්මක කිරීමට කොමිෂන් සභාවට මේ දක්වා නොහැකි වී ඇත.

# 3. විගණන සේවා කොමිෂන් සභාවේ කාර්ය සාධනය - 2017

### *3.1 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 ඇ ව්‍යවස්ථාව යටතේ පැවරී ඇති බලතල හා කර්තව්‍යන්හි ප්‍රගතිය*

| බලතල | ප්‍රගතිය |
|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ සාමාජිකයින්ගේ, පත්කිරීම්, උසස් කිරිම ,මාරු කිරීම්, විනය පාලනය හා සේවයෙන් පහ කිරීම. | ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවය ස්ථාපිත කර නොමැති බැවින් මෙම කාර්යයන් ඉටු කර නැත. |
| ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයට අයත් නිලධරයන්ගේ සේවයට බඳවා ගැනීම් පටිපාටි, පත්කිරීම්, මාරු කිරීම්, විනය පාලනය හා සේවයෙන් පහ කිරීමට අදාළ රීති සකස් කිරීම. | ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවය ස්ථාපිත වූ පසු අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයට අයත් නිලධාරීන් බඳවා ගැනීම්, උසස් කිරීම්, මාරු කිරීම් හා ඊට අනුසාංගික වූ කරුණු වලට අදාළ විගණන සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති දැනටමත් කෙටුම්පත් කර ඇත. |
| ජාතික විගණන කාර්යාලයේ වාර්ෂික ඇස්තමේන්තුව සකස් කිරීම. | ජාතික විගණන කාර්යාලය ස්ථාපිත කිරීමට අදාළ විධි විධාන ඇතුළත් ජාතික විගණන පනත පාර්ලිමේන්තුවේ සම්මත වී නොමැති බැවින් අදාළ කාර්යයන් ඉටු කර නැත. |

### *3.2 කොමිෂන් සභාව විසින් ඉටු කරන ලද අනිකුත් කර්තව්‍යන්*

(අ) කොමිෂන් සභාව සඳහා වෙබ් අඩවියක් ආරම්භ කිරීමට අදාළ කටයුතු කිරීම.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවය ස්ථාපිත කිරීමෙන් පසුව විගණකාධිපති දෙපාර්තමේන්තුවේ සේවය කරන විගණන සේවයට අයත් නිලධාරීන්ගේ තොරතුරු ඇතුළත් කිරීම සඳහා දත්ත පද්ධතියක් නිර්මාණය කිරීම.

### *3.3 පරිපාලන සහ මූල්‍ය කටයුතු*

(අ) විගණන සේවා කොමිෂන් සභාවේ සමස්ත පරිපාලනය, මානව සම්පත් කළමනාකරණය හා තොරතුරු කළමනාකරණ සම්බන්ධ කාර්යභාරය පාලන අංශය විසින් මෙහෙයවනු ලබන අතර, මූල්‍ය කටයුතු හා ස්ථාවර වත්කම් වාර්තා කිරීමට අදාළ සියලු කටයුතු ගිණුම් අංශය විසින් ඉටු කරනු ලබයි.


(ආ) 2017 වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් වශයෙන් රුපියල් මිලියන 52.2 ක් සහ ප්‍රාග්ධන වියදම් වශයෙන් රුපියල් මිලියන 2.8 ක් ලෙස වියදම් දැරීම සඳහා රුපියල් මිලියන 55 ක් වාර්ෂික ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරයෙන් සලසා තිබුණි.


(ඇ) 2017 වර්ෂයේ විගණන සේවා කොමිෂන් සභාවේ ප්‍රතිපාදන, වියදම් සහ ඉතිරිය පිළිබඳව සාරාංශය පහත පරිදි වේ.


| | ප්‍රතිපාදන<br>රු. | මුළු වියදම<br>රු. | ඉතිරිය<br>රු. |
|---|---|---|---|
| පුනරාවර්තන | 52,234,000 | 27,397,518 | 24,836,482 |
| ප්‍රාග්ධන | 2,800,000 | 1,092,552 | 1,707,448 |
| **එකතුව** | **55,034,000** | **28,490,070** | **26,543,930** |

**සටහන :** ජාතික විගණන පනත 2017 වර්ෂය අවසන් වන විටත් සම්මත කර නොතිබුණු බැවින් කොමිෂන් සභාව සඳහා වෙන් කර ඇති සම්පූර්ණ ප්‍රතිපාදන අපේක්ෂිත පරිදි වැය කර නොමැත.

## විගණන සේවා කොමිෂන් සභාවේ මූල්‍ය සාරාංශය (2017)



# 2017 වර්ෂයේ සම්පූර්ණ මූල්‍ය වාර්තාව

| විගණන සේවා කොමිෂන් සභාව | | | | | |
|---|---|---|---|---|---|
| වැය විෂය | විස්තරය | වාර්ෂික ප්‍රතිපාදන වෙන් කිරීම රු. | අතිරේක ප්‍රතිපාදන වෙන් කිරීම රු. | මු.රෙ. 66 මාරු කිරීම් රු. | වියදම රු. |
| **23-01-01** | ***පුනරාවර්තන වියදම්*** | **52,234,000.00** | - | - | **27,397,518.44** |
| | **පුද්ගල පඩි නඩි** | **27,000,000.00** | | | **14,398,806.95** |
| 1001 | වැටුප් හා වේතන | 18,000,000.00 | | (200,000.00) | 6,182,074.88 |
| 1002 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 1,000,000.00 | | | 127,610.42 |
| 1003 | වෙනත් දීමනා | 8,000,000.00 | | 200,000.00 | 8,089,121.65 |
| | **ගමන් වියදම්** | **1,100,000.00** | | | **200.00** |
| 1101 | දේශීය | 100,000.00 | | | 200.00 |
| 1102 | විදේශීය | 1,000,000.00 | | | - |
| | **සැපයුම්** | **2,700,000.00** | | | **1,393,968.05** |
| 1201 | ලිපි ද්‍රව්‍ය හා කාර්යාලයීය වියදම් | 1,500,000.00 | | | 943,259.25 |
| 1202 | ඉන්ධන සැපයීම් | 1,000,000.00 | | | 308,744.00 |
| 1203 | ආහාර පාන හා නිල ඇඳුම් | 200,000.00 | | | 141,964.80 |
| | **නඩත්තු වියදම්** | **1,550,000.00** | | | **277,612.55** |
| 1301 | වාහන නඩත්තු වියදම් | 1,000,000.00 | | | 277,612.55 |
| 1302 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ නඩත්තු වියදම් | 350,000.00 | | | - |
| 1303 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් නඩත්තු වියදම් | 200,000.00 | | | - |
| | **සේවා** | **19,000,000.00** | | | **10,953,869.57** |
| 1401 | ප්‍රවාහන වියදම් | 3,000,000.00 | | | 1,202,933.67 |
| 1402 | තැපැල් හා සංනිවේදන වියදම් | 1,500,000.00 | | | 744,803.69 |
| 1403 | විදුලිය හා ජල වියදම් | 1,000,000.00 | | | 318,297.25 |
| 1404 | බදු කුලී හා දේශීය බදු | 10,500,000.00 | | | 6,750,000.00 |
| 1409 | වෙනත් වියදම් | 3,000,000.00 | | | 1,937,834.96 |
| | **මාරු කිරීම්** | **884,000.00** | | | **373,061.32** |
| 1505 | සම්මාදම් සහ දායක මුදල් | 200,000.00 | | | - |
| 1506 | රජයේ සේවකයන් සඳහා දේපළ ණය පොලී | 684,000.00 | | | 373,061.32 |
| **23-01-01** | ***ප්‍රාග්ධන වියදම්*** | **2,800,000.00** | - | - | **1,092,552.36** |
| | **පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම්** | **1,300,000.00** | | | **18,162.00** |
| 2001 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 500,000.00 | | | 18,162.00 |
| 2002 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 300,000.00 | | | - |
| 2003 | වාහන | 500,000.00 | | | - |
| | **මූලධන වත්කම් අත්පත් කර ගැනීම** | **1,000,000.00** | | | **773,640.36** |
| 2102 | ගෘහ භාණ්ඩ හා කාර්යාලයීය උපකරණ | 1,000,000.00 | | | 773,640.36 |
| | **මානව සම්පත් සංවර්ධනය** | **500,000.00** | | | **300,750.00** |
| 2401 | කාර්ය මණ්ඩල පුහුණු | 500,000.00 | | | 300,750.00 |
| | **මුළු එකතුව** | **55,034,000.00** | - | - | **28,490,070.80** |

(ඇ) විගණන සේවා කොමිෂන් සභා කාර්ය මණ්ඩලයේ දැනුම හා කුසලතා වර්ධනය කිරීමේ වැඩසටහන් යටතේ 2017 වර්ෂය තුල නිලධාරීන් විවිධ ක්ෂේත්‍ර යටතේ පහත දැක්වෙන පරිදි පුහුණු සඳහා යොමු කර ඇත.

| | පුහුණු වැඩසටහනේ නම | තනතුර | නිලධාරින් ගණන |
|---|---|---|---|
| 1 | නේවාසික දෙමළ භාෂා පුහුණු පාඨමාලාව | රියදුරු<br>කාර්යාල කාර්ය සහයක | 01<br>01 |
| 2 | රජයේ වැටුප් සැකසීමේ පද්ධතිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 01 |
| 3 | ලංසු ලියවිලි සකස් කිරීම හා ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය | පරිපාලන නිලධාරි | 01 |
| 4 | විනය කාර්ය පටිපාටි | රාජ්‍ය කළමනාකරණ සහකාර | 01 |
| 5 | දෙමළ භාෂා පුහුණු වැඩසටහන | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි, රාජ්‍ය කළමනාකරණ සහකාර, රියදුරු හා කාර්යාල කාර්ය සහයක | 15 |
| 6 | CIGAS වැඩසටහන පිළිබඳ පුහුණුව | රාජ්‍ය කළමනාකරණ සහකාර | 01 |
| 7 | ඉංග්‍රීසි භාෂාවෙන් විධිමත් ලිපි ලිවීම පිළිබඳ පුහුණුව | රාජ්‍ය කළමනාකරණ සහකාර | 01 |
| 8 | කාර්යාල ක්‍රම පිළිබඳ එක් දින පුහුණු වැඩසටහන | පරිපාලන නිලධාරි, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි, රාජ්‍ය කළමනාකරණ සහකාර, | 09 |
| 9 | කාර්යාල කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | පරිපාලන නිලධාරි | 01 |
| 10 | ආතති කළමනාකරණය | කාර්ය මණ්ඩලයේ සියළු නිලධාරින් | 21 |

# 4. කාර්ය මණ්ඩලය


## *4.1 කාර්ය මණ්ඩල සංයුතිය*

විගණන සේවා කොමිෂන් සභාව සඳහා අනුමත කර ඇති මුළු තනතුරු සංඛ්‍යාව 43කි.එහෙත් ජාතික විගණන පනත මෙතෙක් සම්මත වී නොමැති බැවින් එදිනෙදා පරිපාලන හා මූල්‍ය කටයුතු සඳහා නිලධාරීන් 21 දෙනෙකු පමණක් අනුයුක්ත කිරීමට කටයුතු කරන ලදී.

**විගණන සේවා කොමිෂන් සභාවේ අනුමත හා දැනට සේවයේ නියුතු කාර්ය මණ්ඩලය සහ පුරප්පාඩු 2017.12.31 දිනට**

| තනතුරේ මට්ටම | තනතුර | සේවය | ශ්‍රේණිය/ පන්තිය | අනුමත තනතුරු සංඛ්‍යාව | සේවයේ නියුතු සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | ලේකම් | | | 01 | 01 | 0 |
| | අතිරේක ලේකම් | ශ්‍රී ලංකා පරිපාලන සේවය | විශේෂ | 01 | 0 | 01 |
| | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | ශ්‍රී ලංකා පරිපාලන සේවය | I | 01 | 0 | 01 |
| | අධ්‍යක්ෂ | දීප ව්‍යාප්ත සේවා | I | 01 | 0 | 01 |
| | සහකාර ලේකම් | ශ්‍රී ලංකා පරිපාලන සේවය | III /II | 02 | 0 | 02 |
| | සහකාර අධ්‍යක්ෂ | දීප ව්‍යාප්ත සේවා | III /II | 01 | 0 | 01 |
| | විගණන අධිකාරි | ශ්‍රී ලංකා විගණන සේවය | III /II | 01 | 0 | 01 |
| | ගණකාධිකාරි | ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවය | III /II | 01 | 01 | 0 |
| | නීති නිලධාරි | දෙපාර්තමේන්තු ගත | III /II | 01 | 0 | 01 |
| | එකතුව | | | 10 | 02 | 08 |
| තෘතීය මට්ටම | පරිපාලන නිලධාරි | රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය | අධි පන්තිය | 01 | 01 | 0 |
| | භාෂා පරිවර්තක | භාෂා පරිවර්තක සේවය | II/ I | 03 | 0 | 03 |
| | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි | ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය | 2 පන්තිය II/ I | 01 | 01 | 0 |
| | එකතුව | | | 05 | 02 | 03 |
| ද්විතීය මට්ටම | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය | 3 පන්තිය III /II/ I | 01 | 0 | 01 |
| | රාජ්‍ය කළමනාකරණ සහකාර | රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය | III /II/ I | 15 | 07 | 08 |
| | එකතුව | | | 16 | 07 | 09 |
| ප්‍රාථමික මට්ටම | රියදුරු | රියදුරු සේවය | III/II/ I | 06 | 05 | 01 |
| | කාර්යාල කාර්ය සහයක | කාර්යාල සේවක සේවය | III/II/ I | 06 | 05 | 01 |
| | එකතුව | | | 12 | 10 | 02 |
| එකතුව | | | | 43 | 21 | 22 |

## *4.2 සංවිධාන සටහන*


විගණන සේවා කොමිෂන් සභාවේ සංවිධාන සටහන
කොමිෂන් සභාව
ලේකම්
අතිරේක ලේකම්
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
අධ්‍යක්ෂ
සහකාර ලේකම්
සහකාර ලේකම්
ගණකාධිකාරී
නීති නිලධාරී
සහකාර අධ්‍යක්ෂ
විගණන අධිකාරී
පරිපාලන නිලධාරී
භාෂා පරිවර්තක
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර
රාජ්‍ය කළමනාකරණ සහකාර
රාජ්‍ය කළමනාකරණ සහකාර
රාජ්‍ය කළමනාකරණ සහකාර
රාජ්‍ය කළමනාකරණ සහකාර
අනෙකුත් කාර්ය මණ්ඩලය
(කාර්යාල කාර්ය සහායක/රියදුරු)



## 5. කොමිෂන් සභා රැස්වීම්

සමාලෝචිත වර්ෂය තුල කොමිෂන් සභා රැස්වීම් 12 ක් පැවැත්වීමට කටයුතු යොදා ඇත.

## 6. ස්තුතිය

විගණන සේවා කොමිෂන් සභාවේ කාර්යයන් ඉටුකිරීම සඳහා සහය ලබා දුන් ජනාධිපති ලේකම් කාර්යාලයේ, පාර්ලිමේන්තු මහ ලේකම් කාර්යාලයේ, රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ , මුදල් හා ජන මාධ්‍ය අමාත්‍යාංශයේ, විගණකාධිපති දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයටද, විගණන සේවා කොමිෂන් සභාවේ සමස්ත කාර්ය මණ්ඩලයටද කොමිෂන් සභාවේ කෘතවේදීත්වය පල කරනු කැමැත්තෙමු.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 ඌ ව්‍යවස්ථාව අනුව විගණන සේවා කොමිෂන් සභාව සඳහා 2017 වර්ෂය වෙනුවෙන් මෙම වාර්තාව ඉදිරිපත් කරනු ලැබේ.

| | | |
|---|---|---|
| එච්.එම්. ගාමිණී විජේසිංහ මහතා | සභාපති |  |
| විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මහතා | සාමාජික |  |
| අයි. ගාමිණී අබේරත්න මහතා | සාමාජික |  |
| වී. කන්දසාමි මහතා | සාමාජික |  |
| ඩබ්ලිව්.ඒ. සෝමපාල පෙරේරා මහතා | සාමාජික |  |